# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2024
2026 ජූලි / අගෝස්තු

## සමාජීය විද්‍යා පීඨය

## දේශපාලන විද්‍යාව

## ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රමය හා දේශපාලනය - POLS 18224

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ශ්‍රී ලංකාව සිය යටත් විජිතයක් බවට පත්කරගත් පසුව බ්‍රිතාන්‍ය පාලනය මෙරට වඩාත් හොඳින් තහවුරු කරගනු ලැබුවේ 1833 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමෙනි. මේ පිළිබඳව ඔබගේ අදහස් දක්වන්න.

02. මහජන ඡන්දයෙන් ව්‍යවස්ථාදායකයට නියෝජිතයන් තෝරාගැනීමේ ක්‍රමය 1910 කෲ-මැකලම් ප්‍රතිසංස්කරණ තුළින් ආරම්භ වී වර්ධනය වූ ආකාරය පැහැදිලි කරන්න.

03. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය මගින් හඳුන්වා දෙනු ලැබූ විධායක කාරක සභා ක්‍රමයේ යහපත් ලක්ෂණ හා බැඳුණු ප්‍රතිඵල පිළිබඳව ඇගැයීමක් කරන්න.

04. 20 ශතවර්ෂයේ මුල් භාගය හැඳින්විය හැකි වන්නේ දේශීය දේශපාලන ව්‍යාපාරයන් සහ නායකත්වය මතුවුණු කාල පරිච්ඡේදයක් ලෙසයි. ඒ සඳහා පසුබිම් වූ හේතු දක්වමින් මේ පිළිබඳව සාකච්ඡා කරන්න.

05. 1947 සොල්බරි ආණ්ඩු ක්‍රමය මගින් හඳුන්වා දී තිබූ ද්විත්ව විධායකය පිළිබඳව විස්තර කරන්න.

06. "1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව අර්ධ ජනාධිපති ක්‍රමයක් (Semi-Presidential System) ලෙස හඳුන්වා දී තිබේ." මේ පිළිබඳව අදහස් දක්වන්න.

07. ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලතල සහ කාර්යයන් පිළිබඳව විස්තර කරන්න.

08. ඒකීය රාජ්‍යයක් තුළ බලතල විමධ්‍යගත කිරීම සඳහා 1978 ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය තුළින් පියවර ගෙන තිබෙන ආකාරය පරීක්ෂා කරන්න.

09. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වූ ජාතික රාජ්‍යසභාව සතු වූ සුවිශේෂතා එහි සැකැස්ම සහ බලතල ඇසුරින් සාකච්ඡා කරන්න.

************************************